**ටවර් හෝල් රඟහල පදනම - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---

ටවර් හෝල් රඟහල පදනමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු. 37,296,993 ක් වූ වාහන 09 ක ඵලදායී ජීවකාලය නැවත | මේ වන විට වාහන ප්‍රත්‍යාගණනය සිදු කර අවසන් වාර්තාව ලැබී ඇති බැවින් 2022 වර්ෂය තුලදී ගිණුම්ගත කිරීම සිදුකරන බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රමිතයේ නියමයන් ප්‍රකාරව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි | | |
| (ආ) ටවර්හෝල් රඟහල පදනම සතුව පවතින රු.161,750,000 ක් පිරිවැය වූ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හා රු.1,250,000 ක් පිරිවැය වූ ශබ්දාගාරය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 07 හි ක්ෂය සම්බන්ධ වගන්ති ප්‍රකාරව 2017 වර්ෂයේ සිට ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.16,300,000 ක් අඩුවෙන් හා සමුච්චිත ක්ෂය රු.81,506,962 ක් (2017–2021 කාලපරිච්ඡේදයට අදාල ක්ෂය) අඩුවෙන් දැක්වුණි. | 2022 වර්ෂයේ සිට ක්ෂය කිරිමට කටයුතු කරන බව සඳහන් කරමි. | වත්කම්වල ක්ෂය වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) එල්ෆින්ස්ටන් රඟහල නවීකරණය වෙනුවෙන් දරන ලද වියදම් ස්ථාවර වත්කමක් ලෙස 2019 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණද නිවැරදිව ක්ෂය ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 9,557,988 ක් අඩුවෙන් දැක්වුණි. | 2022 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | රඟහල නවීකරණය වෙනුවෙන් දරන ලද වියදම් ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගත් දින සිට නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ)2021 වර්ෂය සඳහා විලම්භිත අයභාරය ලෙස රු.46,930,196 ක මුදලක් රජයේ ප්‍රාග්ධන ලැබීම් සංචිතයෙන් අයකර පොදු සංචිතයට බැර කර තිබුණද විලම්භිත අයභාරය හඳුනාගැනීමේ පදනම ගිණුම් සටහන් මගින් හෙළිදරවු කර නොතිබුණි. | 2022 වර්ෂයේදි විලම්භිත අයභාර හදුනා ගැනීමේ පදනම හෙලිදරව් කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | විලම්භිත අයභාරය හඳුනාගැනීමේ පදනම ගිණුම් සටහන් මගින් හෙළිදරව් කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සංචිත | 79,368,600 | වසර ගණනාවක් තිස්සේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන ගිණුම් ශේෂයන් 05 ක් පිළිබඳ තොරතුරු /ලිපිගොනු/ලේඛන | මෙම ශේෂයන් පිලිබඳ කිසිඳු තොරතුරක් අනාවරණය කර ගැනිමට නොහැකි බැවින් විගණන හා කළමණාකරණ රැස්වීමේදී ද මේ සම්බන්ධව සාකච්ඡා කරන ලදී. ටවර් හෝල් රඟහල පදනම නමින් මෙම ශේෂයන්ට ආදාලව ගිණුම් පවතින්නේද යන්න රාජ්‍ය බැංකු වලින් විමසීමට යෝජනා වූ අතර ශේෂ තහවුරු කිරිමේ ලිපි මේවන විට බැංකු වෙත යවා ඇත. තවද පදනමේ පසුගිය අවසන් ගිණුම් පරික්ෂාකර මේ සඳහා තොරතුරක් අනාවරණය කර ගැනිමටද ඉදිරියේදි කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.1,069,650 ක් වූ ණයගැති ශේෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් හා රු.20,735 ක් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය වාර්තාවල දක්වා තිබුණද එවැනි ගෙවිය යුතු ශේෂ නොපවතින බව එම ආයතන විසින් තහවුරු කර තිබුණි. | එම ආයතන වලින් මෙම හිඟ මුදල් අයකරගැනිම සඳහා කිහිපවතාවක් ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර මේ වන තෙක් ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබි නොමැත. එබැවින් ඒ සම්බන්ධව ඉදිරි භාරකාර මණ්ඩලයට උපදෙස් සඳහා යොමු කිරිමට සටහන් කර ගතිමි. | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1978 අංක 1 දරන ටවර්හෝල් රඟහල පදනම පනතේ 8 වෙනි වගන්තිය හා පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාල 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් | 1.මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත් එම කාර්යයන් සඳහා නොයෙදවන ලද්දේ නම් එවිට එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පෙරලා පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණද පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණි. | ටවර් හෝල් රඟහල පදනම සහ ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 1986 මැයි 15 වැනි දින මායා නනායක්කාර ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කල අංක 188 දරණ බදු ගිවිසුම අත්සන් කර ඇත.එම ගිවිසුම අනුව කටයුතු කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 1997 අංක 11 දරන ටවර් හෝල් රඟහල පදනම (සංශෝධන) පනතේ 6 වන වගන්තිය | පදනමේ පරමාර්ථයන්ට පටහැනිව රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ සරසවිපාය පැරණි ගොඩනැගිල්ල ඉවත් කර මහල් 08 කින් යුත් බහුකාර්ය වාණිජ ගොඩනැගිල්ලක් හා මීගමුව රුක්මණීදේවි රඟහල පිහිටි ඉඩමේ මහල් කිහිපයකින් යුත් බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාදී තිබුණි. | මෙම රඟහල් 03ම වාණිජ වටිනාකම් වලින් ඉහළ ස්ථානවල පිහිටා ඇති බැවින් මෙම ඉදිකිරීම් තුලින් පදනමට ඉහල ආදායමක් උත්පාදනය කරගත හැකි වන අතර එසේ ලැබෙන අදායම පනතේ අරමුණු ඉටුකර ගැනීමට යොදාගත හැකිවනු ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 119(1), 119(2) සහ 233 | **1.** අනුමැතියකින් තොරව සේවකයින් 51 දෙනෙකුට 2019 මාර්තු 08 දින ගෙවන ලද අතිකාල රු.1,438,435 නීත්‍යානුකූල නොවන ගෙවීමක් හෙයින් එකවර ආපසු අයකර ගත යුතු වුවත් 2020 ඔක්තෝබර් දක්වා පමා කර වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් මෙම ගෙවූ අතිකාල සඳහා අනුමැතිය ලබානොදුන් බැවින් 2020.08.27 ලිපියෙන් සැප්තැම්බර් මස සිට ගෙවන ලද හිඟ අතිකාල අයකර ගනිමින් සිටී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2.ආපසු අයකර ගන්නා වාරික ගණන 12 ඉක්මවන පරිදි අයකර ගැනීමට බලය දිය හැකි වන්නේ අමාත්‍යංශ ලේකම්වරයාට වුවද, අනුමැතියෙන් තොරව ගෙවන ලද අතිකාල වාරික 48 ක් දක්වා අයකර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා අවසරදී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සේවකයන් 21 දෙනෙකුගෙන් රු.612,345 ක ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | ඉතා අඩු වැටුප් ලබන කාර්ය මණ්ඩලයක් සිටින බැවින් ඒ ගැන අවදානය යොමුකර අධ්‍යක්ෂ ජනරාල් විසින්, ගෙවූ අතිකාල මුදල් වාරික වශයෙන් අයකර ගැනිමට තීරණය කල බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී-12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.6 වගන්තිය | 2021 කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා භාරකාර මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි | 2022 වර්ෂයේ සිට නිවැරදි කිරිමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)5.1.3 හා 5.2.1 වගන්ති | 2021 අයවැය වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 ජුනි 28 දිනදී වන අතර අයවැය ලේඛනය සමග අයවැයගත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | භාරකාර මණ්ඩල රැස්වීම් ප්‍රමාද වීම හේතුවෙන් 2021 වර්ෂයේ අයවැය වාර්තාව 2021 ජුනි මස 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. ආදාල ලේඛණ ඉදිරියේදි සකස් කර එවිමට කටයුතු සිදු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii)6.5.3 වගන්තිය | 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2020 වාර්ෂික වාර්තාව සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් අදාල වාර්තා මුද්‍රණ කටයුතු සඳහා භාරදී ඇත. මුද්‍රණයෙන් ලැබුණු පසු පාර්ලිමේන්තු සභාගත කිරිමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv)7.3 වගන්තිය | භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත 1997 සිට ක්‍රියාත්මක කර තිබුණු පදනමේ අත්පොත සඳහා රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය හා භාණ්ඩාගාර එකඟතාවය ලබාගෙන නොතිබුණි. | ටවර් හෝල් රඟහල පදනමේ අත්පොත සකස් කර දැනට අවුරුදු 25 ක් පමණ වන බැවින් වර්තමානයට ගැලපෙන පරිදි මෙම අත්පොත සංශෝධනය කිරිමට ශ්‍රම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අධ්‍යාපන ආයතනය වෙත භාර දී ඇති අතර ඒ සකස් කල විගස අවශ්‍යය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි. | |
| (ඉ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය | 2021 වර්ෂයේ අයවැය වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත 2021 ජුනි 28 දින ඉදිරිපත් කර තිබුණු අතර අභ්‍යන්තර විගණන සැලසුම හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලසුම ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අවශ්‍ය ලේඛණ සමඟ අයවැය ලේඛනය ඉදිරිපත් කිරිමට කටයුතු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ)2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) 11.04 වගන්තිය | භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින් නිරීක්ෂණය වූ ඌනතා හා අතිරික්තතා වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කාලරාමුවට අනුව කටයුතු කිරිමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 11.05 වගන්තිය | භාණ්ඩ සමීක්ෂණ වලදී පොදු 47 මගින් වාර්තා කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 ට පෙර සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කාලරාමුවට අනුව කටයුතු කිරිමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)පශ්වාත් සේවක ප්‍රතිලාභ ලෙස පාරිතෝෂික ගෙවීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.23,343,775 ක් වෙන් කර තිබුණද ඊට අනුරූපී ස්ථාවර තැන්පතුවල ආයෝජන වටිනාකම රු.20,752,432 ක් වූයෙන් රු.2,591,343 ක ආයෝජන ඌනතාවයක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය අයහපත් වීම මත පාරිතෝෂික වෙන් කිරීම සිදු කිරිමට නොහැකි වූ අතර 2023 වර්ෂය තුලදී එම ඌනතාවය සපුරාලීමට කටයුතු කරන බව සඳහන් කරමි. | පාරිතෝෂික වෙන් කිරීමට අනුරූපිව ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 මූල්‍ය වාර්තා වල සංචිත යටතේ ප්‍රසාංගික කලාකරුවන් සඳහා වූ ජනාධිපති සුභසාධන අරමුදල නමින් රු.60,399,700 ක අරමුදල් ශේෂයක් දක්වා තිබුණද අදාල සුභ සාධක අරමුදල නමින් වූ ස්ථාවර තැන්පතු එකතුව රු.70,999,700 ක් විය.ඒ අනුව අරමුදලේ ශේෂය රු.10,600,000 ක් අඩුවෙන් දැක්වුණි. | සංචිත යටතේ රුපියල් 60,399,700 ලෙස දක්වා ඇත්තේ ජනාධිපති සුභසාධක අරමුදලට වරින් වර ලැබුණු මුදල් වල එකතුවක් වශයෙනි. එය ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර පොලී ආදායමෙන් කලාකරුවන්ට සුභසාධන කටයුතු සිදු කර ඇත. ප්‍රතිලාභ ගෙවීමෙන් පසු ඉතිරි වන අතිරික්ත මුදල් නැවත ආයෝජනය කර එම අරමුදල රුපියල් 70,999,700 දක්වා වර්ධනය කර ඇත. මේවන විට එම අතිරික්ත මුදල (10,600,000) අවසන් ගිණුවල සංචිත යටතේ සමුච්චිත ලාභය තුල ඇතුලත්ව ඇත. ඉදිරියේදී එම මුදල සමුච්චිත ලාභයෙන් ජනාධිපති සුභසාධක අරමුදලට මාරු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරමි. | ජනාධිපති සුභ සාධක අරමුදලේ පොලී ආදායම සමුච්චිත ලාභයෙන් ඉවත් කර අරමුදලට මාරු කළ යුතුය. |

**1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20(1) හා 102 වගන්ති වලට පටහැනිව පදනම විසින් 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 1978 අංක 01 දරණ ටවර් හෝල් රඟහල පදනම පනතෙහි 13 (2) වගන්තිය ප්‍රකාරව ටවර් හෝල් රඟහල පදනම සියළු ආදායම් බදු වලින් නිදහස් කර ඇත. | දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.77,244,494 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 96,531,981 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,287,494 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ දායකය රු.12,900,000 කින් අඩු වුවද ,වෙනත් ආදායම රු.1,430,280 කින් වැඩිවීම සහ වැටුප් හා වේතන රු.3,264,526 කින්ද අළුත්වැඩියා සහ නඩත්තු වියදම් රු.3,197,475 කින්ද ආරක්ෂක වියදම් රු.1,017,872 කින්ද ක්ෂය වියදම් රු.19,151,685 කින්ද අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1978 අංක 01 දරන ටවර් හෝල් රඟහල පදනම පනත කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මේ වන විට පනත සංශෝධන කටයුතු සිදු කිරිම සඳහා මුලික කටයුතු සිදු කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | පනත සංශෝධනය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) 2019 මාර්තු 06 දින පදනම විසින් විධිමත් අනුමැතියකින් හා විධිමත් පත්වීමක් නොලද අධ්‍යක්ෂ ජනරාල්වරයකු අත්සන් තබන ලද ලිඛිත බදු ගිවිසුමක් මගින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පදනම සතු සව්සිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය නැවත වසර 30 ක කාලයක් සඳහා ලබාදී තිබුණි. පළමු බදු ගිවිසුම අවසන් වී වසර 06 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද නීත්‍යානුකූල නොවන දෙවන බදු ගිවිසුමෙහි ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට හා කිසිදු කුලී මුදලක් නොගෙවා නීත්‍යානුකූල නොවන අයුරින් පදනම් පරිශ්‍රයේ රැඳී සිටින කර්මාන්ත සංවර්ධන අධිකාරිය පදනම් පරිශ්‍රයෙන් ඉවත් කිරීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. | ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය රාජ්‍ය ආයතනයක් බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පදනම් පරිශ්‍රයෙන් ඉවත් කිරීමට නීතිමය පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික විගණන පනතේ 40(1) වගන්තිය අනුව අමාත්‍යාංශයක් යටතේ ඇති විගණනය කරනු ලබන ආස්ථිත්‍යයන් හී අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම ආස්ථිත්‍යයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතුය.එසේ වුවද පදනමේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පමණක් ඇතුලත් කර ඇති අතර අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ගැනීමට හා අභ්‍යන්තර විගණකවරයකු පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල බඳවා ගැනිමේ පටිපාටිය සංශෝධනය කරන අවස්ථාවකදි ඉදිරිපත් කිරිමට සටහන් කර ගතිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික විගණන පනතේ 38 (ඊ) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික වීම ගණන් දීමේ නිලධාරියෙකුගේ වගකීමක් වේ.ඒ අනුව අභ්‍යන්තර විගණකවරයකු පත්කර නිසිපරිදි අභ්‍යන්තර විගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් හා පරිසරය ගණන් දීමේ නිලධාරී විසින් ඇති කළ යුතු වේ.එසේ වුවද පදනමේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ප්‍රමාණවත් විගණන කාර්ය මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කරන අවස්ථාවකදි ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ටවර් හෝල් රඟහල පදනම විසින් ටවර් රඟහල, එල්පින්ස්ටන් රඟහල හා රුක්මනී දේවී රඟහල යන රඟහල් වෙත ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා පෞද්ගලික ආරක්ෂක සේවා සමාගමක් සමඟ 2019 මාර්තු 11 දින සිට 2020 මාර්තු 10 දින දක්වා වූ එක් අවුරුදු කාලසීමාවකට ලිඛිත ගිවිසුමකට එළඹ තිබුණු අතර පදනම වෙත සැපයිය යුතු ආරක්ෂක සේවක සංඛ්‍යාව සපයා නොතිබියදී 2020 පෙබරවාරි 17 දින සිට 2022 ජනවාරි 11 දින දක්වා අවස්ථා 10 කදී දින දීර්ඝ කරවා දෙමින් එකී ආයතනයෙන් සේවය ලබා ගෙන තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික සේවා සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීමට පදනම කටයුතු කර නොතිබුණි. | TF/AD/10/07 අංක දරන 2019-05-07 දිනැති ලිපියෙන් නියමිත සේවක සංඛ්‍යාවක් යොදවන ලෙස දැනුම් දී තිබුණද එය එසේ නොවන බව පසුව නිරීක්ෂණය වූ බව කාරුණිකව සඳහන් කරමි.<br>පාස්කු ප්‍රහාරය මත රංග ශාලා ආදායම අඩු වූ බැවින් පදනමේ ආදායම් තත්ත්වය පහල මට්ටමකට වැටුණි. එම නිසා පුවත්පත් දැන්වීම් පළ කිරීමට විශාල මුදලක් වැයවීම සහ තැන්පතු මුදල ද නිදහස් කළ යුතුව තිබීම මෙන්ම ඒ වන විට ඔවුන්ගේ සේවාව යහපත් තත්ත්වයක පැවතුණ නිසා මාස 06ක කාලයක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අනුමැතිය මත සේවා දිගුවක් ලබා දී තිබුණි. ඉන් අනතුරුව කාර්යාල වසා දැමීම සහ නිරෝධායන රෙගුලාසි මත මිල ගණන් කැඳවීමට නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික සේවා සඳහා ප්‍රසම්පාදන කටයුතු කිරීමට පදනම කටයුතු කළ යුතුය. |
| (ආ) තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලංසු ලේඛන ඇගයීමට ලක්කර අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන 02 ක වැටුප්, පඩිපාලක සභාවේ මිල ගණනට වඩා අඩු අගයක පැවතීම හා රජයේ ආයතන 2 ක සේවා සපයන බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඇගයීම් කටයුතු වලින් ඉවත්කර තිබුණු අතර තෙවැනි අවම ලංසුව ඉදිරිපත් කරන ලද පෞද්ගලික ආරක්ෂක | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව එකී පෞද්ගලික ආරක්ෂක සමාගම තෝරාගෙන තිබුණද ආයතනයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් අයහපත්වීම මත ඒ වන විට ආරක්ෂක සේවය ලබාදෙනු ලබන ආයතනයට වඩා තෝරාගත් ආරක්ෂක සේවා සපයන ආයතනයට වාර්ෂිකව රුපියල් ලක්ෂ 07ක පමණ | තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ සහ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාගමක් තෝරා පත්කරගෙන තිබූ අතර 2021 අගෝස්තු 18 දින ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණ ඇගයීම් කමිටුවේ මෙම තීරණයට එකඟතාවය දක්වා තිබුණි. | මුදලක් ගෙවිය යුතු බැවින් හා මෙය ආයතනයේ මූල්‍ය තත්වයට තවදුරටත් අයහපත් ලෙස බලපාන නිසා පෙර පවතින මිළ ගණන් යටතේ (එම අවස්ථාවේදී ආරක්ෂක සේවාව සපයනු ලබන ආයතනයේ) සේවාව ලබා ගැනීමට උත්සහ දැරූ නමුත් එයට ප්‍රසම්පාදන කමිටුව තේරූ ආයතනය එකඟ නොවීම මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ඊළඟ දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් පෙර පැවති මිළ ගණන් යටතේ ලබා ගැනීමට කටයුතු කර ඇත. | |
| (ඇ) තෝරාගත් ආයතනයට ලංසු පිරිනමා ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස දන්වා එකී ආයතනය එය පිළිගෙන කාර්යසාධන සුරක්ෂණයක්ද මුදලින් තැන්පත් කර තිබුණද එම ආයතනය සමග ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පැවති ආරක්ෂක සේවා සමාගමේ කාලය දීර්ඝ කර තිබුණි. | ප්‍රසම්පාදන කමිටුව තීරණය කල මිලට වඩා සේවාව සපයමින් සිටි ආයතනයේ මිල විශාල ලෙස පහල අගයක් බැවින් පැවති මුදලට සේවාව ලබාගැනීමට භාරකාර මණ්ඩලයට දැන්වීමට කටයුතු කරන ලදී. එම තීරණය ලැබෙන තෙක් පැවති ආරක්ෂක සේවා සපයනු ලබන ආයතනයට ගිවිසුම තවදුරටත් දීර්ඝ කරන ලදි. භාරකාර මණ්ඩල පත්‍රිකාව සලකා බැලූ භාරකාර මණ්ඩලය ආයතනයට ලැබෙන ප්‍රතිලාභය සලකා පැවති මිලටම පැවති ආරක්ෂක සේවා ආයතනයෙන් අදාළ සේවාව ලබා ගැනීමට තීරණය කරන ලදී. | ප්‍රසම්පාදන කමිටුවේ තීරණයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) මෙහිදී 2021/2022 වර්ෂයේ ප්‍රසම්පාදන කාර්ය නිම කිරීමට වසරකට ආසන්න කාලයක් ගත කර තිබුණද, අවසානයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව, පඩි පාලක සහා අඥා පනතේ විධි විධානයන්ට පටහැනිව කටයුතු කරන පැවති සමාගමටම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද එම සමාගම සමග ලිඛිත ගිවිසුමකට එළඹීමටද පදනම කටයුතු කර නොතිබුණි. | පෙර ගිවිසුම් ප්‍රකාරව ආරක්ෂක සේවා ලබා ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව සදහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට තනතුරු 16 කට අදාලව පුරප්පාඩු 26 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් තෘතීය මට්ටමේ තනතුරක් ද්විතීය මට්ටමේ තනතුරු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් ඒ අතර විය. | පුරප්පාඩුව පැවැති තනතුරු කිහිපයක් සඳහා 2020-12-21 සහ 2021-01-21 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ සම්මුඛ පරීක්ෂණ නොපවත්වන ලෙස ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කෙටි පණිවිඩයක් හරහා උපදෙස් ලබා දී ඇත. සියලුම බඳවා ගැනීම් නැවත දැනුම්දෙන තුරු අත්හිටුවන ලෙසට අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දී ඇත . ජාතික වෘත්තීය සුදුසුකම සපුරා ඇති අය සම්මුඛ පරීක්ෂණ සඳහා ඉල්ලුම්කර නොමැති වීම හේතුවෙන් මෙම පුරප්පාඩු පිරවීම සිදුකළ නොහැකිව පැවතිණි.2021.08.28 දිනැති “රාජ්‍ය වියදම් සමාලෝචනය” යන මැයෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය හා එකී තීරණය අනුව සේවක බඳවා ගැනීම් සිදුකර නොමැත. | වසර කිහිපයක සිට පැවතෙන පුරප්පාඩු ඇති අතර පුරප්පාඩු ඇතිවන අවස්ථාවේදීම කළමනාකරණය විසින් සොයා බලා කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරි සැලැස්මට අනුව වැඩ සටහන්/ව්‍යාපෘති 35 ක් වෙනුවෙන් රු.මි.58ක් වෙන් කර තිබුනද ඉන් 21 ක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ සඳහා වෙන්කර තිබූ මුදල රු.මි.13.478 ක් විය. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩ සටහන් 21ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | වසංගත තත්වයන් හෝ වෙනත් අර්බුදකාරී තත්වයන් කලින් හඳුනාගත හැකි අවස්ථා වලදී ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමේදී තාත්විකව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අංශයේ මුළු මිනිස් පැය ගණන වූ මිනිස් පැය 3184 න් සියයට 66 ක් එනම් මිනිස් පැය 2110 ක් පමණක් වැය කර තිබූ අතර අභ්‍යන්තර විගණනය සැලසුම් කළ ආකාරයට සිදු කිරීම අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | කොරෝනා වසංගතය නිසා සැලසුම් කළ කාර්යයන් ඉටු කිරීමට නොහැකි විය. | ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයන්ද සැලකිල්ලට ගෙන සැලසුම් තාත්විකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |